# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (ඔක්තෝබර්-1 සතිය)

## 13 තේමාව - පොළොව හා අහස

දුවේ පුතේ අද පැවරුම කරන්න කලින් මේ දේවල් සොයාගන්න.

(වතුර බාල්දියක්, බෝලයක්, රෝදයක්)

හැම දෙයක් ම නැත්නම් වතුර බාල්දිය ගන්නකෝ.

- මේවත් අරගෙන ඔබේ ගෙවත්තට යන්න.
- වත්තේ මේ වගේ තැන් තියෙනවද බලන්න.
  උස්තැනක්, තැනිතලා තැනක්, බෑවුම් සහිත තැනක්.
- රැගෙන ගියදේ පැත්තකින් තියලා මේ ක්‍රියාකාරකම් කරන්නකො.
  - උසතැනට දිවීම. උසතැන සිට ආපසු දුවගන ඒම.
  - උසතැන සිට බෝලය පෙරලා බලන්න.
  - රෝදය තල්ලු කරන්න.
  - එම ස්ථානයට ජලය දමා ගලායන ආකාරය බලන්න.
  - මේ ආකාරයට ම තැනිතලාවේත් ක්‍රියාකාරකම් කරන්න.
  - බෑවුම සහිත ස්ථානයෙත් ක්‍රියාකාරකම් කරන්න.

❖ දැන් ඔබ කළ ක්‍රියාකාරකම ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට ඔබ සිතන පිළිතුර හිස්තැන ලියන්න.

1. ඔබ වෙහෙසක් දැනුණේ උස් ස්ථානයට දුවන විටද? උස් ස්ථානය් සිට පහළට දුවන විටද?

   ..........................................................................................................

2. වඩා වේගයෙන් බෝලය පෙරළී ගියේ තැනිතලාවේ ද? බෑවුම සහිත ස්ථානයේ ද?

   ..........................................................................................................

3. උස් ස්ථානයට ජලය වත් කළවිට කුමක් සිදුවී ද?

   ..........................................................................................................

4. රෝදය දක්කාගෙන යාමට පහසු තැනිතලාවේ ද? පහළ සිට උස් ස්ථානයට ද?

   ..........................................................................................................

5. ඔබේ ගෙවත්තේ පොළොව තැනින් තැන මෙසේ වෙනස් වුණේ කොහොම ද?

   ..........................................................................................................

❖ ඔබ වැඩිහිටියෙක් ද උදවු කරගෙන පහත දැක්වෙන ස්ථාන අතරින් එකක ආකෘතියක් හදන්න. (මැටිවලින්.)
1. ක්‍රීඩා කිරීමට පිට්ටනියක්.
2. ගොඩනැඟිලි සෑදීමට සුදුසු ස්ථානයක්.
3. ගොවිතැන් කිරීමට සකස් කරගත් ගොවිපළක්.

E nanapiyasa 3 ශ්‍රේණිය පරිසරය -13 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.